# ලංසු සඳහා ආරාධනයයි.

## ඉඩම්,පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය

# සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ ඉඩම්,පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කර්මාන්ත ඉටුකිරීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | ව්‍යාපෘතිය | ලියාපදිංචි ශ්‍රේණිය හා විෂය | ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු | ලංසු බැදුම්කර මුදල(රු) | ඇස්තමේන්තු ගත වැඩ වටිනාකම (රු.මිලියන) |
|---|---|---|---|---|---|
| 01. | මාරුක්වතුර ගොවිපල සඳහා යෝජිත මාර්ග පද්ධතිය කොන්ක්‍රීට් කිරීම | C8/C7 | 2000.00 | 37,000.00 | 2.44 |
| 02. | රත්නපුර දිස්ත්‍රික් පශු වෛද්‍ය රෝහල ඉදිකිරීම - I අදියර | C6/C5 | 3500.00 | 174,000.00 | 17.35 |
| 03. | රත්නපුර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ පැති බැම්ම ඉදිකිරීම | C8/C7 | 2000.00 | 25,400.00 | 2.53 |
| 04. | කරපිංච රජයේ කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ දේශන ශාලාව හා නේවාසිකාගාරය ඉදිකිරීම - II අදියර (2 කොටස) | C6/C5 | 5000.00 | 234,000.00 | 23.37 |
| 05. | ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයේ හෙළ බොජුන්හල ඉදිකිරීම | C7/C6 | 3500.00 | 92,000.00 | 9.17 |
| 06. | උදුගොඩ පුහුණු මධ්‍යස්ථානයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය අළුත්වැඩියා කිරීම | C7/C6 | 2000.00 | 95,000.00 | 6.28 |

01. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසු කරුවන්ට සබරගමුව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකි අතර ( දුරකතන අංක 045 2224425) 2021.06.21 සිට 2021.07.13 දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ලියාපදිංචි සහතිකය (පළාත් සභා හෝ CIDA) සහ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර ලංසු ලිපි ලේඛන පරික්ෂාකර බලා පහත ලිපිනය වෙත ඉල්ලීමක් කර ඉහත සඳහන් පරිදි ගාස්තු ගෙවීමෙන් ලංසු ලේඛන කට්ටල මිලදී ගත හැක. මේ පිළිබඳ වැඩිදුර විස්තර සබරගමුව පළාත් සභා වෙබ් අඩවියෙන් (www.sg.gov.lk) ලබාගත ගත හැක

02.මෙම ලංසු කැඳවීම විවෘත තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලබන අතර සෑම කර්මාන්තයක්ම ඇස්තමේන්තු වටිනාකම රු. මි.50ට වඩා අඩු බැවින් රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 04/2016(ii) හා 04 / 2016 (iii) අනුව ප්‍රාදේශීය ප්‍රමුඛතා හා අදාල CIDA ශ්‍රේණිගත ප්‍රමුඛතා පදනම් කර ගනිමින් ලංසුකරුවන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.එමෙන්ම එම චක්‍රලේඛයට අදාලව පසුව නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 03/2020 හා 03/2020(i) යන චක්‍රලේඛයන්ද ප්‍රසම්පාදන කටයුතු සඳහා අදාල වේ.

03. සියළුම ලංසුකරුවන් මෙම ප්‍රසම්පාදනය සඳහා ඉහත සඳහන් ලංසු බැදුම්කර වටිනාකමට අදාලව ලංසු බැදුම්කර වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි පිළිගත් බැංකුවකින් ලබාගත් 2021.07.14දින සිට 2021.11.11 දින දක්වා වලංගුවන පරිදි ලේකම්, ඉඩම්,පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය,සබරගමුව පළාත් සභාව,නව නගරය,රත්නපුර නමින් අදාල ප්‍රසම්පාදනයේ නමට ලබාගත් ලංසු බැදුම්කරයක් මගින් හෝ අදාල ප්‍රසම්පාදනය නමින් ගෙවන ලද ලංසු සුරක්ෂණ මුදල ලෙස අදාල අමාත්‍යාංශ ලේකම් වෙත අදාල මුදල් ගෙවා ලබාගත් රිසිට් පත ලංසු ලේඛණ සමග ඉදිරිපත් කල යුතුය.ලංසු ලේඛණ සමග බැදුම්කරය ඉදිරිපත් කිරීමේදී මුදල් ගෙවා ලබාගත් රිසිට්පතෙහි හෝ ලංසු සුරක්ෂණයේ මුල් පිටපත අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතුවේ.

04.සම්පූර්ණ කරන ලද ලංසු ලේඛණ **2021.07.14** දින **පෙ.ව 10 .30** ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පළාත් සභා සංකීර්ණයේ පළමු මහලේ පිහිටි ඉඩම්,පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශයේ ලේකම් කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.

05.ලංසු ලියවිලි ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළියෙල කර ඇති අතර,සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන් වෙන් වශයෙන් ලියුම් කවරවල බහා මුද්‍රා තබා නැවත එක් කවරයක බහා මුද්‍රා තබා කවරයේ ඉහළ වම්පස ඉහල කෙලවරේ අදාල ව්‍යාපෘතියේ නම සඳහන් කළ යුතුය.

06.ලංසුව විවෘත කිරීම ලංසුපත් භාර ගැනීම අවසන් වූ වහාම සිදුකරන අතර ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැක.

07.ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම හෝ කොටසක් පිළිගැනීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතුවේ.

08.සියළුම ලංසු 2021.10.12 දක්වා වලංගු විය යුතුය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ඉඩම්,පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා
සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර,
2021/06/18